සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT, WELFARE AND KANDYAN HERITAGE

මගේ අංකය / எனது இல / My No: DSD/HO/MF/BR/05 | ඔබේ අංකය / உமது இல / Your No: ........................ | දිනය / திகதி / Date: 2018.02.01

සියළුම සමෘද්ධි ප්‍රජාමුල බැංකු කළමණාකරුවන් හා
බැංකු සමිති කළමණාකරුවන් වෙත.

**<u>සමෘද්ධි ප්‍රජාමුල බැංකු සහ බැංකු සමිති ලියාපදිංචිය අළුත් කිරිම.</u>**

සමෘද්ධි ප්‍රජාමුල බැංකු සහ බැංකු සමිති ලියාපදිංචි කිරිම පිළිබදව යොමුකල ඉහත සමාංක දරණ චක්‍රලේඛ අංක ස.ප්‍ර.බැ.2017/06 හා 2017.03.17 දිනැති ලිපිය හා බැදේ.

02. එම චක්‍ර ලේඛ ලිපිය මඟින්, සමෘද්ධි බැංකු සහ සමෘද්ධි බැංකු සමිති වල පාලක මණ්ඩලය, විධායක කමිටුව පත්කිරිම පිළිබදව හා සමෘද්ධි බැංකු හා බැංකු සමිති ලියාපදිංචි කිරිමට අදාල උපදෙස් ලබාදි ඇත. සමෘද්ධි බැංකු කටයුතු වලට අදාල 2017 මාර්තු 07 නිකුත් කල අංක 2009/08 ගැසට් පත්‍රයේ සදහන් නියෝග අනුව සමෘද්ධි බැංකුවක් සහ බැංකු සමිතියක් සෑම වර්ෂයකම මාර්තු31ට යටත් පිරිසෙයින් දින30කටවත් ප්‍රථම ලියාපදිංචිය අළුත් කල යුතුය.

03. ඒ අනුව ඔබ විසින් **<u>2018 පෙබරවාරි 28 දිනට පෙර සමෘද්ධි බැංකුවේ සහ බැංකු සමිතියේ ලියාපදිංචිය අළුත් කිරිම සදහා අයදුම් පත්‍රයක් යොමු කල යුතුවේ</u>**. සමෘද්ධි බැංකු සහ බැංකු සමිති ලියාපදිංචිය අළුත් කිරිමේ ගාස්තුව රු.1000/- වන අතර අදාල චෙක්පත "කළමණාකරු ලංකා බැංකුව,බත්තරමුල්ල ආයෝජන ගිණුම - 3417925ට බැර පිණිස" යොමුකල යුතු වේ. මෙම ලියාපදිංචිය අළුත් කිරිමේ ගාස්තුවද බැංකු මට්ටමේදි කේත අංක 2141 ගිණුමට සහ සමෘද්ධි බැංකු සමිති මට්ටමේදි කේත අංක 6213 දරණ ගිණුමට හර කල යුතුවේ.

04.ලියාපදිංචිය අළුත් කිරිමේ අයදුම් පත්‍රය, ප්‍රජාමුල සංවිධාන විස්තර, මහ සභා රැස්විම් සහ පාලක මණ්ඩල තොරතුරු, මුල්‍ය තත්ව විස්තර, ආදායම් ප්‍රකාශවල තොරතුරු ලබාගැනිමේ ආකෘති සමෘද්ධි වෙබ් අඩවියේ ඇතුලත් කර ඇත. ප්‍රජා සංවිධාන තොරතුරු ඉදිරිපත් කිරිමේදි නැවත සියළුම ප්‍රජාසංවිධාන තොරතුරු යොමු කිරිම අත්‍යාවශ්‍ය නොවන අතර සංශෝධිත තොරතුරු පමණක් යොමු කිරිම ප්‍රමාණවත් වේ.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ (මානව සම්පත්) / பணிப்பாளர் (மனிதவளம்) / Director (Human Resource) | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මුල්‍ය) / பணிப்பாளர் (குறு நிதி) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2873799 | 011-2871672/2872202 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2873996 | 011-2889002 | 011-2869742 | 011-2887469 | Hot Line: 011- 2887722 |
| E-mail- | diradmin@samurdhi.gov.lk | dg@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Desktop -shani |
| | Hot Line :0112-889007 | | | | |

05.මෙම ලියාපදිංචිය අළුත් කිරිමේ අයදුම් පත්‍රය යොමු කිරිමට පෙර 2018 වසරට අදාලව සමෘද්ධි බැංකුවේ සහ බැංකු සමිතියේ පාලක මණ්ඩලය හා විධායක කමිටුව පත්කර ගත යුතුවේ. ඒ අනුව මෙම පාලක මණ්ඩලය හා විධායක කමිටුවේ සභාපතිගේ හා ලේකම්ගේ අත්සනින් අයදුම්පත් යොමු කල යුතු අතර, අදාල පාලක මණ්ඩලය හා විධායක කමිටු පත් කිරිම සදහා පැවැත්වූ රැස්වීම් වාර්තාවේ සහතික කල පිටපතක්, සභාපතිගේ සහ ලේකම්ගේ අත්සන් හා නිල මුද්‍රාව සහිතව යොමු කල යුතුවේ.

06.කෙසේ නමුත්,2018 වසරේ පෙබරවාරි මස 10වන දින පැවැත්වීමට නියමිත පලාත් පාලන මැතිවරණ කාලය තුල මහ සභා රැස්වීම් පැවැත්වීමේ අපහසුතාවය නිසා පෙබරවාරි මස 10 වෙනි දිනට පසු අදාල මහ සභා රැස්වීම් පවත්වා ලියාපදිංචිය අළුත් කිරිම සදහා අයදුම් පත්‍රය යොමු කල යුතුය.

07. 2017.12.12 දින ඉහත සමාංකය යටතේ නිකුත්කල සමෘද්ධි බැංකු සහ බැංකු සමිතිවල පාලක මණ්ඩල පත්කිරිමට අදාල ලිපිය අනුව 2018.03.31 දින දක්වා මහ සභාරැස්වීම් පැවැත්වීමට අදාල දිනය මේ අනුව සංශෝධනය වන අතර 2018.02.28 දිනට පෙර බැංකු හා බැංකු සමිති වල මහ සභා රැස්වීම් පවත්වා ලියාපදිංචිය අළුත් කිරිම සදහා අයදුම්පත් යොමු කල යුතුය.

08.ඔබගේ සමෘද්ධි බැංකුවට සහ බැංකු සමිතියට අදාල ලියාපදිංචි අංකය සහ ලියාපදිංචි කල දිනය සමෘද්ධි වෙබ් අඩවියේ සදහන් කර ඇත.

09.පසුගිය වර්ෂයේ ලියාපදිංචිය සදහා අයදුම් පත්‍ර යොමු කිරිමේදි පහත දූර්වලතා දක්නට ලැබිණි.

1. නියමිත දිනට අයදුම්පත්‍ර යොමු නොකිරිම.
2. අදාල නිලධාරින්ගේ අත්සන්, නිලමුද්‍රා නොමැති වීම.
3. ගරු සභාපතිවරුන්ගේ අත්සන් සහ නිලමුද්‍රා නොතිබීම.
4. අසම්පූර්ණ අයදුම්පත්‍ර සහ ඇමුණුම් යොමු කිරිම.

ඒ අනුව ඉහත දූර්වලතා මගහරවා ගෙන ඉතා සැලකිලිමත්ව නියමිත දිනට පෙර ලියාපදිංචිය අළුත් කිරිමට අයදුම්පත්‍ර යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් -

1. ලේකම්,සමාජ සවිබල ගැන්වීම්,සුභ සාධන හා කන්ද උඩරට උරුමය පිළිබද අමාත්‍යාංශය - දැ.ගැ.ස
2. දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/දිස්ත්‍රික් ලේකම් - දැ.ගැ.ස
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ - දැ.ගැ.පි සහ අ.ක.ස
4. ප්‍රාදේශිය ලේකම් - දැ.ගැ.පි
5. සියළුම අධ්‍යක්ෂවරුන්(සමෘද්ධි සං. දෙ. ) - දැ.ගැ.පි
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක - දැ.ගැ.පි සහ අ.ක.ස